**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 වන දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය යටතේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරනු ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

**(අ) පුනරාවර්තන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම. | නිර්දේශය |
|---|---|---|
| හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සූර්ය විදුලි බල පද්ධතියෙන් සමාලෝචිත වර්ෂයේ ජාතික පද්ධතියට විදුලිය ඒකක 5915 ක් ලබාදී තිබුණු අතර, පරිභෝජනය කළ ඒකක ප්‍රමාණය 7602 ක් විය. විදුලිය වියදම් ගිණුම් ගත කිරීමේදී පරිභෝජනය කළ ප්‍රමාණයෙන් නිෂ්පාදනය කළ ප්‍රමාණය හිලව් කර බිල්පත් පියවීම හේතුවෙන් විදුලි ඒකක 5915 කට අදාළ වියදම හා ආදායම මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් නොවිණි. | දැනට පවතින ගිණුම් ක්‍රමය යටතේ ගිණුම්ගත කිරීමක් සිදු නොවන බැවින් මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අවධානය යොමුකරන ලද බව දන්වා ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

(ආ) **දේපල පිරියත හා උපකරණ.**

---

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට රාජ්‍ය නොවන සංවිධාන 04 කින් සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂවල ලැබී තිබුණු විවිධ වත්කම් විෂයන් 97 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සියලු වත්කම් පිළිබඳ තොරතුරු අදාළ කාර්යාල දැනුවත් කර තක්සේරු කර ගිණුම් ගත කිරීම් කිරීමට කටයුතු කර කරන ලෙස අදාළ අංශ දැනුවත්කර ඇත. | වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය. |
| (ii) | රාජ්‍ය නොවන සංවිධානයකින් ඉදිකර දෙන ලද රු.23,584,227 ක අලෙවි මධ්‍යස්ථාන දෙකක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | අලෙවි මධ්‍යස්ථාන 2ක ගිණුම් ගත කර ඉදිරියේදි වාර්තා ඉදිරිපත් කරන බව දන්වා ඇත. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය. |
| (iii) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු වාර්තාව ලද වහාම ඉදිරපත් කරන බව දන්වා ඇත. | ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **අග්‍රිම ශේෂය**

---

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම . | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින වටිනාකම රු.900,878 ක අග්‍රිම ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි. | ඉදිරි කටයුතු සඳහා ස්වදේශ කටයුතු ලේකම් වෙත යොමුකර ඇති බව වාර්තා කර ඇත. | අග්‍රිම ශේෂයට බලපා ඇති නොපියවූ අත්තිකාරම් ශේෂය නිරවුල් කළ යුතුය. |

(ඇ) අවසන් තොගය ගිණුම් ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හඟුරන්කෙත හා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කර්යාලවල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පාරිභෝජන ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.5,467,752ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එමෙන්ම නුවරඑළිය, අඹගමුව සහ වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවසන් පාරිභෝජන ද්‍රව්‍ය තොග පැවතියද ඒවායේ වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | දැනට පවතින ගිණුම් ක්‍රමය යටතේ ගිණුම්ගත කිරීමක් සිදුනොවන බැවින් මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කරන බව දන්වා ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම.** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයන් 02 ක් සඳහා මුදල් රෙගුලාසිවලට අනුකූල නොවන ලෙසට රු.1,586,756 ක බැරකම් ඇති කරගෙන තිබුණි. | වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම මත බැරකම් ඇති වී ඇති බව වාර්තා කර ඇත. | මුදල් රෙගුලාසි 94 අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | වැය විෂයන් 03 ක් සඳහා අක් මුදල් ඉතිරිව තිබියදී රු.300,240 ක බැරකම් ඇති කර ගෙන තිබුණි. | 2021 පෙබරවාරි 31 දිනට අදාළ ගෙවීම් සඳහා අත් මුදල් ප්‍රමාණවත් නොවීම, වවුචර් පත් දෙසැම්බර් 31න් පසුව ඉදිරිපත් වීම නිසා බැරකම්වලට ඇතුළත් කර ඇති බව වාර්තා කර ඇත. | අක් මුදල් ඉතිරිව තිබියදී බැරකම් ඇති කර නොගත යුතුය. |

(ඇ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4:2:2, 4:2:4, 4:2:5, 4:5, 4:6, හා 6:3 වගන්ති | රු. 403,052 | ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින හා මිය ගොස් ඇති නිලධාරීන් 3 දෙනෙකුගෙන් අය වියයුතු ණය මුදල් අය කර ගෙන නොතිබුණි. | විශ්‍රාම පාරිතෝෂිකය හා මරණ පාරිතෝෂිකයන් අනුමත වී නොමැති වීම මත ණය ශේෂ නිරවුල් වී නොමැත. විශ්‍රාම පාරිතෝෂිකය හා මරණ පාරිතෝෂිකයන් අනුමත වූ වහාම අදාළ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2019 ජූනි 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2019 අනුව හා ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ නිවාස අදියර 1 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් සඳහා රු.4,044,166 ක් වැය කර ඉදිකිරීම කර තිබුණද ඒහි කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් 2022 මාර්තු වන විටත් භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්යව තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ඇස්තමේන්තු සකස්කර ප්‍රතිපාදන ලබා ගැනීමට ඉදිරිපත් කළත් 2021 වර්ෂය සඳහා ලබා දී තිබුණේ මිලියන 05 ක ප්‍රමාණයකි. එබැවින් එම මුදලට සරිලන සේ බිම් මහලේ හැකිතරම් ප්‍රමාණයක් ඉදිකරන ලදී. 2022 වර්ෂයට ද මිලියන 05 ක් වෙන්කර ඇති බැවින් මෙම වර්ෂයේ ද බිම් මහලේ වැඩ නිමකර පළමු මහලේ කොටසක් ඉටු කිරීමට ඇස්තමේන්තු සකස්කර ප්‍රතිපාදන ඉල්ලා ඇති බව දන්වා ඇත. | අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරවා ගෙන ඉදිකිරීම් නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආපදා සහන සේවා යටතේ නැවත පදිංචි කිරිමේ වැඩ සටහනේ ප්‍රගතිය සියයට 100 ක් ලෙස දක්වා තිබුණද, කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ නායයෑම් නිසා නැවත පදිංචි කළ යුතු පවුල් 105 ක් වෙනුවෙන් නිවාස 105 ක් ඉදිකිරීම සඳහා රු. 126,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටද ඉදිකර නොතිබුණි. | නිවාස 98 න් 40ක් ගිවිසුමට අනුව එක් නිවසක ලක්ෂ 2 ක වැඩ සිදුකර ඇත. වතු නිවාස සමුපකාර සමිතිය සමගින් ගිවිසුමගත වී ඉදිකිරීම් ආරම්භකර ඇත. මේ සම්බන්ධයෙන් අමාත්‍යංශයෙන් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් විගණන කළමනාකරණ කමිටුවේදී ද සාකච්ඡා කොට ඇත. | ව්‍යාපෘතිය සම්පූර්ණ කර එම අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ජීප් රථයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට භාවිතයෙන් ඉවත්කර වර්ෂ 1 1/2ක් පමණ කාලයක් නිෂ්කාර්යව පැවැතුණි. | අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අමතර කොටස් සොයා ගැනීමට අපහසු බව දන්වා ඇත. | වාහනවල අලුත්වැඩියා කටයුතු සිදුකර ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2022 ජූලි 18 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

| | විගණන විමසුමේ අංකය සහ විස්තර | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එන්යූර්/ඒ/කේසීඑච්/2022/09 - අඩු ආදායම්ලාභි පවුල්වල සාමාජිකාවන් 100,000 ක් සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමේ ජාතික වැඩ සටහන, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. | පිළිතුරුලබාදී නොමැත. | විගණන විමසුමට නියමිත කාලය තුල පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සීඑල්/එන්ර්/ඒ/කේසීඑච්/2021/13 - අංක 40 සී දරන කණිෂ්ඨ පොදු සේවා නිවාසයේ පදිංචිය පිළිබඳ පරීක්ෂාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. | -එම- | -එම- |
| (ඇ) | එන්යූර්/ඒ/එන්ර්/2021/06 - <br><br> ඉඩම් බදු දීම් පරීක්ෂාව, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. | -එම- | -එම- |

**3.4** **කළමනාකරණ දූර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම** | **නිර්දේශය** |
|---|---|---|
| විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන චක්‍රලේඛය අනුව, තම කොට්ඨාශයේ විශ්‍රාමිකයෙක් මිය ගියහොත් දින 07 ක් ඇතුළත විශ්‍රාම වැටුප් අංකය සහිතව ඒ බව වහාම විශ්‍රාම වැටුප් ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ග්‍රාම නිලධාරි විසින් දැනුම් දිය යුතුය. එහෙත් කොත්මලේ සහ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුල ඒ අනුව කටයුතු කර නොතිබීම නිසා 2016 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාල සීමාවට අදාළව වැඩිපුර ගෙවා තිබුණු පිළිවෙලින් රු.2,135,772 ක් හා රු.1,581,391 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවතුණි. | දුබලතා විශ්‍රාම වැටුප හා සේවා විශ්‍රාම වැටුප ඒකාබද්ධ කළ පසු අයකරන බවත් වාර්තා කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

**------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක සියලු අංශවල අරමුණු සලකා බලා තිරසර සංවර්ධන අරමුණු කරා ළගාවීමට දර්ශක පිළියෙල කර නොතිබුණි. එමෙන්ම වාර්තාවේ ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව පිහිටුවාගත් ඉලක්ක සහ සත්‍ය වශයෙන් ළගාකර ගත් ඉලක්ක පිළිබඳ සංඛ්‍යා විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ අංශ වලින් සකස්කර ඇති තිරසර අරමුණු දර්ශකවලට අනුව ළගාකරගෙන ඇති ඉලක්ක ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කර්යසාධන වාර්තාවේ දක්වා ඇති බව දන්වා ඇත. | කාර්යසාධනය වාර්ෂිකව නිශ්චිතව තක්සේරු කළ හැකි පරිදි දර්ශක ස්ථාපනය කළ යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්මික නිලධාරීන් සංඛ්‍යාව 11ක් වුවද, කාර්මික නිලධාරී තනතුරු 10 ක් පුරප්පාඩු වී පැවතුණි. | මේ සම්බන්ධයෙන් නිරන්තරයෙන් අමාත්‍යංශය දැනුවත්කර ඇති බව දන්වා ඇත. | පුරප්පාඩු පුරවා ගත යුතුය. |